# IV. කාර්ය මණ්ඩල පුවත්

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා අග්නි දිග ආසියාතික මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මේලනයට සහභාගිවීම සඳහා 1968 පෙබරවාරි මස 12 වැනි දින ක්වාලාලම්පූර් නගරය බලා ලංකාවෙන් පිටත්ව ගිය අතර, 1968 පෙබරවාරි මස 20 වෙනි දින ආපසු සැපත් විය.

තෙන්නකෝන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වශයෙන් 1968 ජූලි මස 1 වෙනි දින සිට නැවතත් පත් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකාවේ විකල්ප අධිපති ද වන බැංකුවේ අධිපති වරයා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකාවේ අධිපති වන මුදල් අමාත්‍ය ගරු යූ. බී. වන්නිනායක මහතා හා සමග ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ජාත්‍යන්තර සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ බැංකුවේ, වොෂිංටන්හි දී පැවැත්වුණ වාර්ෂික සාකච්ඡාවට සහභාගි විය. 1968 සැප්තැම්බර් මස 19 වෙනි දින ලංකාවෙන් පිටත්වූ එතුමා 1968 ඔක්තෝම්බර් 20 වෙනි දින ආපසු සැපත් විය.

අධිපති වරයා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළදී, නියෝජ්‍ය අධිපති එස්. ඊ. පී. ජැන්ස් මහතා, මුදල් පනතේ 24 වෙනි ඡෙදයෙහි ප්‍රකාර මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළේය.

මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් එච්. ජේ. සමරක්කොඩි මහතා ලෝක බැංකුවේ සහ අරමුදලේ සාකච්ඡා සඳහා, දිවයිනෙන් බැහැරව සිටි කාලයේදී සහ 1968 නොවැම්බර් 15 වෙනි දින විශ්‍රාම ගැනීමට පෙරාතුව නිවාඩු ගෙන සිටිය දී ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් එම්. රාජේන්ද්‍ර මහතා මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයා වශයෙන් කටයුතු කළේය.

ආචාර්ය ගාමණී කොරයා ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන්, රජයේ සේවාවේ තවදුරටත් නිරත විය.

ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂක ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න, 1968 නොවැම්බර් මස 15 වෙනි දින සිට අධිපතිගේ සහකාරයකු වශයෙන් පත් කරනු ලැබීය.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරි ඕ. බී. ගුණවර්ධන මහතා, 1968 නොවැම්බර් 15 වෙනි දින සිට අභ්‍යන්තර විගණක වශයෙන් පත් කරනු ලැබීය.

විනිමය පාලක ජේ. ජී. පි. ජයසුන්දර මහතා, 1968 නොවැම්බර් 15 වෙනි දින සිට බැංකු පරිපාලන අධ්‍යක්ෂක වශයෙන් පත් කරනු ලැබීය.

අභ්‍යන්තර විගණක සී. එච්. ප්‍රනාන්දු මහතා, 1968 නොවැම්බර් 15 වෙනි දින සිට විනිමය පාලක වශයෙන් පත් කරනු ලැබිය.

විශේෂ නිලධාරි පී. එච්. සිරිවර්ධන මහතා, රාජ්‍ය ණය අධිකාරි වශයෙන් 1968 නොවැම්බර් මස 15 වෙනි දින සිට පත් කරනු ලැබීය.

බැංකු පරිපාලක අධ්‍යක්ෂක යූ. ඩබ්ලිව්. බී. අලුවිහාරේ මහතා, සංවර්ධන බැංකුවේ උප දේශක වශයෙන් 1968 නොවැම්බර් මස 15 වෙනි දින සිට පත් කරනු ලැබීය.

ආර්ථික පර්යේෂණ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂක, ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් 1968 නොවැම්බර් 15 වෙනි දින සිට වැඩ බලන ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂක වරයා වශයෙන් පත් කරනු ලැබීය. 1968 ඔක්තෝබර් මැද භාගයේ දී සිට පුරා මසක් බැංකොක්හි දී පැවැත් වූ ආසියානු, ඈත පෙරදිග ආර්ථික කොමිෂමේ උපදේශක වරුන්ගේ කණ්ඩායමක වැඩ කටයුතු සඳහා ද ඔහු සහභාගි විය.

ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න 1968 දෙසැම්බර් 11 සිට 14 දක්වා, ගරු අගමැතිවරයා විසින් පත් කරනු ලැබූ රජයේ නියෝජිත කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන් බැංකොක්හි දී පැවැත්වූ, ආසියානු හා ඈත පෙරදිග ආර්ථික කොමිෂම මගින් සංවිධානය කරණ ලද ආසියාතික ආර්ථික සහයෝගතාවය පිළිබඳ වූ තුන්වැනි අමාත්‍ය සම්මේලනයට සහභාගි විය.

එම්. සවාමිනාදන් මහතා සහ ආචාර්ය එම්. ආර්. පී. සල්ගාදු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සේවාවේ තවදුරටත් නිරත වූහ.

එම්. පී. පෙරේරා මහතා 1968 මාර්තු 14 වෙනි දින සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යටතේ නේපාල් රාෂ්ට්‍ර බැංකුවේ පර්යේෂණ උපදේශකයකු වශයෙන් කටයුතු කිරීම සඳහා වසරක කාලයකට සේවාවෙන් මුදා හරිනු ලැබීය.

සී. ඒ. බී. එන්. ජයරාජා මහතා 1968 පෙබරවාරි මස ක්වාලාලම්පූර්හිදී පැවැත් වූ අග්නි දිග ආසියාතික මහා බැංකු අධිපති වරුන්ගේ සම්මේලනයට අධිපති වරයා කැටුව සහභාගි විය. බැංකොක්හි, ආසියාතික සහ ඈත පෙර දිග ආර්ථික කොමිෂමෙහි තනතුරක් සඳහා ඔහු 1968 මැයි 1 වෙනි දින සිට 1969 ජනවාරි 15 වෙනි දින දක්වා, බැංකුවේ සේවාවෙන් මුදා හැරි අතර, 1968 මාර්තු මස නව දිල්ලියේ දී පැවැත්වූ එක්සත් ජාතීන්ගේ වෙළඳ සහ සංවර්ධන කොමිෂමේ දෙවන සභා වාරයට සහභාගි වූ ලංකා නියෝජිත කණ්ඩායමෙහි ද සාමාජිකයකු විය. තවද, ඔහු 1968 සැප්තැම්බර් මස 5 වෙනි දින සිට 7 වෙනි දින දක්වා පැවති මලයාසියාවේ නිගාරා බැංකුව විසින් කැඳවනු ලැබූ මහා බැංකු නිලධාරීන්ගේ ද්විතීය ශිල්පීමය කමිටු රැස්වීමෙහි ලංකාවේ නියෝජිතයා වශයෙන් සහභාගි වූ අතර, 1968 දෙසැම්බර් 4 වෙනිදා සිට 6 වෙනිදා දක්වා බැංකොක් හි පැවති අග්නි දිග ආසියාතික මහා බැංකුවල තුන්වැනි ශිල්පීමය කමිටුවේ රැස්වීමට ද සහභාගි විය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී මහා බැංකුවේ, පහත සඳහන් නිලධාරීහු තාවකාලිකව රජයේ සේවය වෙත මුදා හැරි අතර, සමහරු තවදුරටත් රජයේ සේවයේ නිරත වූහ.

එම්. එම්. සෙනෙවිරත්න, ඩී. ආර්. සිරිවර්ධන, ආචාර්ය එන්. රාමචන්ද්‍රන්, ආචාර්ය ජී. උස්වත්තෙ ආරච්චි සහ එන්. එම්. කප්පාගොඩ යන මහත්වරු තවදුරටත් ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සේවාවෙහි නිරත වූහ.

පී. බී. කරඳවල මහතා තවදුරටත් මුදල් අමාත්‍යාංශයෙහි සේවාවේ නිරත විය.

1968 අප්‍රේල් මස 1 වෙනි දින සිට එච්. ආර්. ද සොයිසා මහතා, මහ භාණ්ඩාගාරයේ සේවාව සඳහා මුදා හරිනු ලැබීය.

පෙරසේම මහ බැංකුවේ නිලධාරීන් බොහෝ දෙනෙක්, රජය විසින් පත් කරණ ලද විවිධ කමිටුවල සේවාවේ යෙදුණාහ.